# අනුරාධපුර ප්‍රහාරය පිටුපස ඇති පණිවුඩය

පසුගිය දා අනුරාධපුර ගුවන් හමුදා කඳවුරට කරන ලද ප්‍රහාරය පිළිබඳ විවිධ මත පළ වී ඇත. ඒ ප්‍රහාරයේ දී ත්‍රස්තවාදීන් පිරිසක් බිමින් පැමිණ කඳවුරට පහර දී ඇති අතර තවත් පිරිසක් ගුවනින් පැමිණ බෝම්බ හෙළා ඇත. ප්‍රහාරයෙන් කඳවුරට විශාල හානියක් සිදු වී ඇති අතර ලංකාව අපකීර්තියට භාජනය කරන කතා විදේශීය මාධ්‍ය ආයතන විසින් පචාරය කෙරෙයි. ඇතැම් විදේශීය මාධ්‍ය ආයතනවල සේවය කරන බටහිරයන්ට කතා සපයන ජනමාධකරුවන් යැයි කියාගන්නවුන් සිංහලයන් බව අමතක නොකළ යුතු ය. එහෙත් ඔවුන් ජීවත්වීම සඳහා කුලී වැඩ කරන බව අමතක කිරීමට කිසිවකුටවත් ඉඩ නො දිය යුතු ය. වැටුපට සේවය කරන්නෝ සියළු දෙනා කුලී කරුවෝ වෙති. කුලීකරුවන්ට තම පැවැත්ම සඳහා බොහෝ අවස්ථාවල තම ස්වාමීන් සතුටු කිරීමට සිදුවෙයි.

ඒ කෙසේ වෙතත් ත්‍රස්තවාදීන්ට බිමින් කඳවුරට ඇතුල්වීමට ඉඩලැබීමෙන් පෙන්නුම් කෙරෙන්නේ ආරක්‍ෂාව පිළිබඳ නොවිසඳුණු ප්‍රශ්න කිහිපයක් ඇති බව ය. ඉතා ඉක්මණින් මේ ප්‍රශ්න විසඳීමට මහන්සි ගත යුතු ය. එසේ නොමැති වුවහොත් වඩාත් විනාශකාරී ප්‍රතිඵල නුදුරු අනාගතයේ දී අත්දැකීමට සිදුවනු ඇත. එහෙත් ඉන් කියැවෙන්නේ එ ජා පක්‍ෂය ප්‍රකාශකර ඇති ආකාරයට ගෝඨාභය රාජපක්‍ෂ මහතා ආරක්‍ෂක ලේකම් ධුරයෙන් ඉල්ලා අස්විය යුතු බව නො වෙයි. එ ජා පක්‍ෂයට ඒ මහතා එකී ධුරයෙන් අස්වනු දැකීමේ දොළදුකක් ඇති බව රහසක් නො වෙයි. ඒ අන් කිසිවක් නිසා නොව ඒ මහතා අස්කිරීම කොටින්ගේ අවශ්‍යතාවක් නිසා ය. මෙවැනි අවස්ථාවක වගකිවයුතු විරුද්ධ පක්‍ෂයක කාර්යය විය යුත්තේ අන් සියළු ප්‍රශ්න අමතක කර කොටි පැරදවීමට කොන්දේසි විරහිතව ආණ්ඩුවට සහාය දීම ය. එ ජා පක්‍ෂය විසින් ගුරුකොට ගැනෙන බටහිර රටවල විරුද්ධ පක්‍ෂ ක්‍රියාකරන්නේ එලෙස ය. එහෙත් බටහිර රටවල් ද එ ජා පක්‍ෂයට එවැනි උපදෙසක් නොදෙන බව ඉතා පැහැදිලි ය.

එයට හේතුව කොටි ත්‍රස්තවාදීන් බටහිරයන්ගේ " හුරතල් චූටි කොටි පැටවුන්" වීම ය. අනුරාධපුර ප්‍රහාරය සැලසුම් කරනු ලැබුයේ කොටි විසින් පමණක් යැයි අපි නො සිතමු. කොටි කෙසේ වෙතත් එතරම් දක්‍ෂයෝ නො වෙති. ඔවුන් පිළිබඳ මහා ප්‍රතිරූපයක් මැවුවෝ බටහිරයෝ ය. එදා සිට ම කොටි අනභිබවනීය කණ්ඩායමක් ලෙස හඳුන්වාදෙනු ලැබුයේ බටහිරයන් හා ඔවුන්ගේ මෙරට ගැත්තන් විසිනි. මේ ඊනියා අනභිබවනීය කොටි නැගෙනහිර පළාතෙන් පැරදී ගියේ හිකනළුන් ලෙස ය. ඒ පිළිබඳ බටහිරයන්ගේ එතරම් ප්‍රසාදයක් වී යැයි සිතිය නො හැකි ය. එමෙන් ම නැගෙනහිර මෙහෙයුම් පැවති දිනවල එ ජා පක්‍ෂය නිතර ඇසූ ප්‍රශ්නයක් වුයේ නැගෙනහිරට පමණක් පහර එල්ල කරන්නේ ඇයි ද යන්න ය.

අද ලංකාවේ බටහිරයන්ගේ නියෝජිතයෝ දෙදෙනෙක් වෙති. එක් නියෝජිතයකු නම් කොටි සංවිධානය ය. අනෙක් දේශපාලන නියෝජිතයා එ ජා පක්‍ෂය ය. බටහිරයෝ කොටි පරදිනු දැකීමට කැමති නො වෙති. එපමණක් නොව ඔවුහු කොටි පැරදවීමට අකුල් හෙලති. එක් බටහිරයකු පසුගිය දා ප්‍රකාශකර තිබුනේ තමන් කොටි පැරදවීමට ඉඩ නොදෙන බව ය. තමන්ගේ ත්‍රස්තවාදී නියෝජිතයා පැරදීම වැළැක්වීමට කටයුතු කරන බටහිරයෝ තම ඊනියා ප්‍රජාතන්ත්‍රවාදී නියෝජිතයා මැතිවරණයෙන් ජයග්‍රහණය කරවීමට කටයුතු කරති. බටහිරයන්ට අද අවශ්‍ය වනුයේ මහින්ද රාජපක්‍ෂ ආණ්ඩුව පරාජය කර එ ජා පක්‍ෂය දිනවා ඊනියා ජනවාර්ගික ප්‍රශ්නය තම නියෝජිතයන් දෙදෙනා අතර කෙරෙන සාකච්ඡාවලින් කොටින්ට වාසිවන අයුරින් හා ඊළමකට මග කැපෙන අයුරින් " විසඳීම ය." ඒ හේතුව නිසා කිනම් ප්‍රශ්න තිබුණ ද මේ ආණ්ඩුව ආරක්‍ෂා කිරීමට ජාතික බලවේගවලට සිදුවෙයි.

නැගෙනහිර පළාතේ දී ඊනියා සැහැල්ලු ගුවන්යානා යොදා නොගත් කොටි උතුරේ මෙහෙයුම්වල දී ඒ යොදාගනිති. කොටින්ට මේ හුවන්යානා ලබාදෙන්නේ කවු ද? අල් ක්වයිඩා වැනි සංවිධානයකට ද නැති හුවන්යානා මිළ දී ගැනීමට කොටින්ර හැකියාවක් වේ ද? පසුගියදා නාවික හමුදාව විසින් නැව්වල තිබූ කොටි හුවන්යානා කිහිපයක් ම විනාශ කෙරිණි. එහෙත් කොටින්ට වැළ නොකැඩී ගුවන්යානා ඡැබෙයි! කොටින්ට මෙතරම් ප්‍රමාණයක් ආයුධ ලබාදී ඇත්තේ කවු ද යන්න ද ප්‍රශ්නයකි. අපි මේ ප්‍රශ්නය දිගින් දිගට ම අසා ඇත්තෙමු.

ගුවන්යානා පිළිබඳව ජනතාව අතර ඇත්තේ වැරදි අවබෝධයකි. පළමුව කියැවුනේ කොටින්ට එක් ගුවන් යානයක් හෝ දෙකක් හෝ පමණක් ඇති බවත් ඉරාණමඩුවේ ඇති ධාවන පථයකින් මේ ගුවන් යානා අහසට නැංවෙන බවත්

© Prof. Nalin De Silva

ය. එහෙත් කලින් දුටුවේ යැයි කී ගුවන්යානා ඉරාණමඩුවේ සිට නොව මුහුදින් පැමිණි බව පැහැදිලි ය. ලංකාව අසල මුහුදේ ඇති නැවකින් හෝ නැව්වලින් හෝ ගුවන්යානා ගුවන්ගත වන්නේ ද? අනෙක් අතට කොටින්ට වැළ නොකැඩී ගුවන්යානා ලැබෙන්නේ කෙසේ ද? මේ ගුවන්යානා පදවන්නේ කොටි ත්‍රස්තවාදීන් විය හැකි ය. එහෙත් ඒ පැදවීම් පිටුපස සිට ඒ සංවිධානය කරන්නේ කවු ද?

කොටි සංවිධානය අද ඊනියා ජාත්‍යන්තර ප්‍රජාවගේ බළල් අතක් වී අවසාන ය. කොටින්ට තනියම තීරණ ගැනීමේ හැකියාවක් තිබිණි නම් ඔවුන් නැගෙනහිර පළාතේ දී ගුවන් යානා යොදාගනු නො අනුමාන ය. එහෙත් බටහිරයන්ගෙන් ඒ සඳහා ඔවුන්ට උපදෙස් ලැබී නැති බව පැහැදිලි ය. කොටින්ට මෙන් නොව බටහිරයන්ට නැගෙනහිර පළාත තරමක් ප්‍රශ්නකාරී ය. එහි සිංහලයෝ ද මුස්ලිම් ජනයා ද  වාසය කරති. බටහිරයෝ ජාත්‍යන්තරයේ දී මුස්ලිම් සංස්කෘතියට විරුද්ධ වුව ද ලංකාවේ දී සිංලයන්ට විරුද්ධව මුස්ලිම්වරුන් ද යොදාගැනීමට උත්සාහ කරති. අවාසනාවකට එක් මුස්ලිම් පක්ෂයක් අද මෙරට බටහිරයන්ගේ වුවමනා එපාකම් වෙනුවෙන් පෙනී සිටියි.

අනුරාධපුර ප්‍රහාරය සැලසුම් කර ඇත්තේ හුදෙක් ප්‍රහාරයක් පමණක් ලෙස නො වෙයි. කොටි පැරදවීමට ඉඩ නොදෙන්නේ යැයි කියන ඊනියා ජාත්‍යන්තර ප්‍රජාව නියෝජනය කරන්නන් මේ ප්‍රහාර පිටුපස නැතැයි කිසිවකුටවත් නිශ්චිත ව කිවහැකි නො වෙයි. අනුරාධපුර ප්‍රහාරයෙන් ලංකාණ්ඩුවට දෙන පණිවුඩයක් වෙයි. උතුරේ කොටි පරාදකිරීමට අපි ඉඩ නොදෙන්නෙමු යැයි ඊනියා ජාත්‍යන්තර ප්‍රජාව පණිවුඩයක් එවා ඇත. එක්සත් ජාතික පක්ෂය කොන්දේසි විරහිතව කොටි පැරදවීමට ආණ්ඩුවට සහාය දෙනවා වෙනුවට තම හාම්පුතුන් වූ බටහිරයන්ගේ අවශ්‍යතාව වෙනුවෙන් ආණ්ඩුවේ මානුෂික මෙහෙයුම් අඩපණ කිරීම සඳහා ගෝඨාභය රාජපක්ෂ මහතා ආරක්ෂක ලේකම් තනතුරින් අස්විය යුතු බවට ප්‍රකාශ නිකුත් කරයි.

අද බටහිරයෝ එක් පැත්තකින් එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් කොමිසමේ කාර්යාලයක් ලංකාවේ පිහිටුවීමට ආණ්ඩුවට බලපෑම් කරති. 1988-90 කාලයේ පුද්ගලයන් අතුරුදහන්වන විට බටහිරයෝ නෑසූ කණින් නොදුටු ඇසින් සිටියෝ ඔවුන්ගේ ප්‍රජාතන්ත්‍රවාදය අනුව ය. බටහිරයන්ගේ ප්‍රජාතන්ත්‍රවාදය කාගේදෝ එක කාහට වුවමනා වූ ආකාරයට ය. අද ලෝකයේ සිදුවන්නේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වය හා යම් යම් ආකාරයකට ඒ සමග එකඟ නොවන අය අතර ඇති අරගලයකි. බටහිරයෝ එක් පැත්තකින් ලංකාවේ මානව අයිතිවාසිකම් කඩ වී ඇතැයි කියමින් ආර්ථික තහංචි නමැති මනුෂ්‍යත්වට එරෙහි වූ ආයුධය යොදාගැනීමට, හැකිනම් එක්සත් ජාතීන්ගේ හමුදා එවීමට බලා සිටිති. ආණ්ඩුව බටහිරයන්ට කිසිම වූ ආකාරයකින් යටත් නොවිය යුතු ය. ආණ්ඩුව ස්ථිරව අධිෂ්ඨානශීලීව බටහිරයන්ට නොනැමී කටයුතු කරබ්නේ නම් ඔවුන්ට කළහැකි දෙයක් නොමැති බව පසුගිය දා මියන්මාරයේ ඇති වූ සිද්ධිවලින් පැහැදිලි වෙයි. මියන්මාරයේ භික්ෂු පෙළපාලි පවා බටහිරයන් විසින් සංවිධානය කෙරී ඇති බව දැන් දැන් හෙළිදරවු වෙමින් පවතියි. පසුගිය 24 වැනි දා දි අයිලන්ඩ් පුවත්පතේ ද මේ සම්බන්ධ තොරතුරු රැගත් ලිපියක් පළවිය. මියන්මාර ආණ්ඩුවේ භික්ෂු ඝාතන අපි අනුමත නො කරමු. එහෙත් ඒ ආණාඩුව රටේ ස්වෛරීභාවය රැකගනිමින් බටහිර යටත්විජිතවාදයට නොනැමී සිටීම ලංකාණ්ඩුවට ද ආදර්ශයකි. කිසිම තර්කයකට නැති සතිඅන්ත කසිකබල් පුවත්පතක බොරු ප්‍රබුද්ධයකු මා මෙයින් කියන්නේ ලංකාණ්ඩුවට ද භික්ෂූන් වහන්සේ ඝාතනය කිරීමට ය යන තමන්ගේ  බුද්ධියට සරිලන නිගමනයට එළඹෙනු ඇත.

අනුරාධපුර ප්‍රහාරයෙන් කියන්නේ එක්සත් ජාතීන්ගේ හමුදා එවීමට ඉඩ නොලැබෙන්නේ නම් බටහිරයන් මෙයටත් වඩා රට අභ්‍යන්තරයේ ම කොටින්ට උපකාර කරන බව ය. කොටි ඩොලර්, පවුම් කෝටි ගණන් වියදම් කරන්නේ දෙමළ ජනයාගෙන් මුදල් අයකර ගැනීමෙන් හා මත් ද්‍රව්‍ය හා වෙනත් වෙළඳාම්වලින් පමණක් යැයි අපි නො සිතමු. අද ආණ්ඩුව බටහිර මැදිහත්වීම්වලට බිය නොවී ස්ථිර ප්‍රතිපත්තියක පිහිටා කටයුතු කළ යුතු ය. කොටි සංවිධානය සමුලඝාතනය කිරීම අද දවසේ අවශ්‍යතාව වී ඇත. කොටි දුර්වල කර සාකච්ඡාවලට එළඹීම වැනි මනස්ගාතවලට දැන් කිසිම ඉඩක් දිය යුතු නො වේ. ඊනියා ජනවාර්ගික ප්‍රශ්නයක් නැති වුවත් සංවර්ධනය උදෙසා ඇතැම් බලතල පළාත්සභාවලට හා ප්‍රාදේශීය සභාවලට පැවරීමට ව්‍යවස්ථාව සංශෝධනය කිරීම එකකි. කොටි සමුලඝාතනය කිරීම තවත් එකකි. ඒ දෙක පටලවා නොගත යුතු ය. පාරිභාෂික වචනවලින් නම් ඒ අන්‍යෝන්‍ය වශයෙන් බහිෂ්කාර වෙයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva